# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1937/20 - 2015 ඔක්තෝබර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2015.10.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය එදිරිසිංහ ආරච්චිගේ ඉසුර දේවප්‍රිය ධර්මසේන පෙරේරා වන මා විසින් ඉහත ප්‍රඥප්තියේ අදාළ වගන්ති සමග කියවිය යුතු පහත සඳහන් රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට බලපැවැත්විය යුතුය.

එදිරිසිංහ ආරච්චිගේ ඉසුර දේවප්‍රිය ධර්මසේන පෙරේරා,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු,
ජලසම්පාදන හා ජලපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### රීති

1. මෙම රීති බස්නාහිර පළාතේ, 2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම ප්‍රඥප්තියේ 7(3) සහ 9(2) උපවගන්ති යටතේ, බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පහත දක්වා ඇති ගාස්තු හා මුදල් ඊට අනුරූප කාර්යයන් සඳහා ගෙවිය යුතුය.

| *කාර්යය* | *ගාස්තු මුදල් ප්‍රමාණය රු.* |
|---|---|
| *අ.* උකස්ගන්නන්ගේ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම | 25,000/- |
| *ආ.* උකස්ගන්නන්ගේ ව්‍යාපාරය සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තුව | 5,000/- |
| *ඇ.* උකස්ගන්නන්ගේ ව්‍යාපාරය කර ගෙන යාම සඳහා තැබිය යුතු ඇප තැන්පතු මුදල | 100,000/- |

3. ඇප තැන්පතු මුදල මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන රාජ්‍ය බැංකුවක පමණක් තැන්පත් කළ යුතුය.

11 - 130


1A - PG 2658 — 506 (2015/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*